සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# අ.පො.ස (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2026

| ගිණුම්කරණය I | 33 | S | I | 13 ශ්‍රේණිය | පැය දෙකයි |
|---|---|---|---|---|---|

විභාග අංකය - ..........................................

වැඩසටහන් සම්පාදනය කළ නොහැකි සාමාන්‍ය ගණක යන්ත්‍ර භාවිතා කිරීමට අවසර ලැබේ.

උපදෙස් -

- සියළුම ප්‍රශ්නවලට පිලිතුරු සපයන්න
- අංක 01 සිට 30 දක්වා වූ ප්‍රශ්නවලට නිවරදි පිලිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති වරහන තුල ලියන්න.
- අංක 31 සිට 50 දක්වා වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාල තිත් ඉරි මත හෝ වරහන තුල ලියන්න
- සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු හිමි වේ.

| ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|
| 01-30 | |
| 31-50 | |
| එකතුව | |

01.කළමණාකරන ගිණුම්කරනයට අදාලව පහත කුමන ප්‍රකාශ සත්‍ය වන්නේද?

A. පොදුකාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව පිලියෙල කර භාණ්ඩයක ඇස්තමෙන්තුගත ඒකක පොදුකාර්ය පිරිවැයගනනය කිරීම.

B. බැංකු සැසඳුම් ප්‍රකාශනයක් පිලියෙල කර මුදල් පාලන ගිණුමේ ශේෂය හා බැංකු ප්‍රකාශනයේ ශේෂය සැසඳීම.

C. ඉදිරි වර්ෂයේදී සංවිධානය කිරීමට නියමිත භාණ්ඩ ප්‍රදර්ශනය සඳහා අයවැය ලේඛණය පිලියෙල කිරීම.

D. ආයතනයේ සේවකයන්ගේ මාසික වැටුප් ලේඛනය පිලියෙල කිරීම.

(1) A,B හා C
(2) A,C හා D
(3) A,B හා D
(4) A හා D
(5) C හාD

(........)

02.සීමිත පොදු සමාගමක් සාමාන්‍ය කොටස් හිමියන්ට අතුරු ලාභාංශ ගෙවීමට අදාලව නිවරදි ගිණුම්කරන පිලිවෙත තහවුරු කරන ගිණුම්කරන සංකල්පය වන්නේ

(1) ගැලපුම් සංකල්පය
(2) උපචිත සංකල්පය
(3) යාථාරූපි සංකල්පය
(4) ගිණුම්කරන ඒකක සංකල්පය
(5) ආරක්ෂණ සංකල්පය

(........)

3,4 හා 5 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

A. කුසල් ව්‍යාපාරයේ 2026.03.31 දිනට බැංකු ප්‍රකාශනයේ හර ශේෂය රු 48 000 ක් වූ අතර,එදිනට මුදල් පාලන ගිණුමේ ශේෂය මීට වෙනස් විය.වෙනසට හේතු පහත දැක්වේ.

B. මාර්තු 25 දින තැන්පත් කළ රු 18 000 ක චෙක්පතක් මාර්තු 31 දින වන විටත් ගිණුමට බැර වී නැත.

C. මාර්තු 27 නිකුත් කරන ලද රු 11 500 ක චෙක්පතක් අප්‍රේල් 04 වන දින නිෂ්කාශනය වී ඇත.

D. බැංකුව අයකර බැංකු ගාස්තුව රු 1 450 ක් බැංකු ප්‍රකාශනයේ පමණක් සඳහන් වේ.

E. මාර්තු 24 දින නිකුත් කරන ලද රු 4 200 ක චෙක් පත බැංකුව විසින් අගරු කර ඇතත්, එය ව්‍යාපාරයේ ගිණුම්වල වාර්තාකර නැත.


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
දෙවන පිටුව බලන්න

03.2026.03.31 දිනට ගැලපුම් කිරීමට පෙර ව්‍යාපාරයේ මුදල් පාලන ගිණුමේ ශේෂය වනුයේ

(1) රු 35 850 බැර
(2) රු 54 500 බැර
(3) රු 48 000 හර
(4) රු 44 250 හර
(5) රු 44 250 බැර

(........)

04. 2026.03.31 දිනට සංශෝධිත මුදල් පාලන ගිණුමේ ශේෂය වනුයේ

(1) රු 41 500 බැර
(2) රු 44 250 බැර
(3) රු 54 500 බැර
(4) රු 38 750 හර
(5) රු 38 750 බැර

(........)

05.ඉහත වෙනස්කම් වලින් බැංකු සැසඳුම් ප්‍රකාශයේ වාර්තාකරණ අයිතම වනුයේ

(1) A,B හා C
(2) A හා B
(3) C හා D
(4) B,C හා D
(5) A,C හා D

(........)

- 06 ,07 හා 08 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

දිලුම් ට්‍රේඩර්ස් විසින් 2026 මාර්තු මාසයේදී ගැමුණු ව්‍යාපාරය සමඟ පහත ගනුදෙනු සිදු කරන ලදී. (ව්‍යාපාර දෙකම VAT සඳහා ලියාපදිංචි වී ඇත. VAT අනුපාතය 15% කි)

| | |
|---|---|
| මාර්තු 5 | ගැමුණු ව්‍යාපාරයෙන් භාණ්ඩ ණයට ගත්තා රු 60 000 යි.මෙය VAT රහිත ලැයිස්තුගත මිල වන අතර වෙළෙඳ වට්ටම 10% කි. |
| මාර්තු 07 | මාර්තු 05 දින ණයට ගත් භාණ්ඩවලින් 50% ක් ආපසු යැව්වා. |
| මාර්තු 15 | මාර්තු 05 දින ණයට ගත් භාණ්ඩ රු 103 500 කට VAT සහිතව මුදලට වික්කා. |
| මාර්තු 20 | ගැමුණු ව්‍යාපාරයට ගෙවිය යුතු මුදල ගෙවූ අතර ,ලද වට්ටම රු 2 000 කි. |

06. දිලුම් ට්‍රේඩර්ස්හී පොත් වල ඉහත ගනුදෙනු වාර්තා කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛන අනුපිළිවෙලින්

(1) ගෙවීම් වවුචරය,බැර පත,ලදු පත,ගෙවීම් වවුචරය
(2) විකුණුම් ඉංවොයිසිය,හර පත,ලදුපත,ගෙවීම් වවුචරය
(3) ගෙවීම් වවුචරය,හරපත,ලදුපත,ගෙවීම් වවුචරය
(4) ගැනුම් ඉංවොයිසිය,හරපත,ලදුපත,ගෙවීම් වවුචරය
(5) ගැනුම් ඉංවොයිසිය,බැරපත,ලදුපත,ගෙවීම් වවුචරය (........)

07.ගැමුණු ව්‍යාපාරය පොත්වල ඉහත ගණුදෙනු වාර්තා කිරීමට අදාල මූලික පොත් අනුපිළිවෙලින්,

(1) ගැනුම් ජර්නලය,ආපසු යැවුම් ජර්නලය,මුදල් ලැබීම් ජර්නලය,මුදල් ගෙවීම් ජර්නලය
(2) මුදල් ගෙවීම් ජර්නලය,ආපසු යැවුම් ජර්නලය,මුදල් ලැබීම් ජර්නලය,මුදල් ගෙවීම් ජර්නලය
(3) පොදු ජර්නලය,ආපසු යැවුම් ජර්නලය,මුදල් ලැබීම් ජර්නලය,මුදල් ගෙවීම් ජර්නලය
(4) ගැනුම් ජර්නලය,ආපසු එවුම් ජර්නලය,මුදල් ලැබීම් ජර්නලය,මුදල් ගෙවීම් ජර්නලය
(5) ගැනුම් ජර්නලය,ආපසු යැවුම් ජර්නලය,මුදල් ගෙවීම් ජර්නලය,මුදල් ලැබීම් ජර්නලය (........)

08.දිලුම් ව්‍යාපාරයේ මාර්තු මාසයට අදාල මෙහෙයුම් ප්‍රතිඵලය වන්නේ,

(1) රු 72 450
(2) රු 65 000
(3) රු 67 000
(4) රු 74 450
(5) රු61000

(........)

- ප්‍රශ්ණ අංක 09 හා 10 ප්‍රශ්න වලට පිලිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

ටයිටේනියම් මල්පෝච්චි නිපදවන ටයිටන් නිෂ්පාදන සමාගම 2025/26 වර්ෂය සඳහා පහත තොරතුරු ලබා දී ඇත.

| | |
|---|---|
| පාරිභෝජනය කල ද්‍රව්‍ය පිරිවැය | රු 120 000 |
| නිපද වූ මල්පෝච්චි ගනන | 1 200 |
| මල්පෝච්චියක විකුණුම් මිල | රු 1 000 |

ප්‍රාථමික පිරිවැය පාරිභෝජනය කල ද්‍රව්‍ය පිරිවැය මෙන් දෙගුණයකි.
මල්පෝච්චියක විකුණුම් මිල තීරණය කරනු ලබන්නේ විකුනුම් මිලට 25% ක ලාභයක් එකතු කරමිනි.
වසර තුල නිපදවූ මල්පෝච්චිවලින් ඒකක 900 ක් වසර අවසාන වන විට අලෙවි කර ඇත.


iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers - Model Answers - Study Resources

09.2025/26 වර්ෂය සඳහා නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය හා මුළු නිෂ්පාදන පිරිවැය නිවරදිව දැක්වෙන්නේ

| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | මුළු නිෂ්පාදන පිරිවැය |
|---|---|
| (1) රු 240 000 | රු 920 000 |
| (2) රු 650 000 | රු 900 000 |
| (3) රු 240 000 | රු 900 000 |
| (4) රු 720 000 | රු 900 000 |
| (5) රු 660 000 | රු 90 0 000 |

(........)

10.ටයිටන් නිෂ්පාදන ව්‍යාපාරයේ 2025/26 වර්ෂය සඳහා විකුණුම් පිරිවැය හා දළ ලාභය වන්නේ

| විකුණුම් පිරිවැය | දළ ලාභය |
|---|---|
| (1) රු 610 000 | රු 290 000 |
| (2) රු 600 000 | රු 300 000 |
| (3) රු 675 000 | රු 225 000 |
| (4) රු 525 000 | රු 675 000 |
| (5) රු 225 000 | රු 675 000 |

(........)

- 11 හා 12 ප්‍රශ්නවලට පිලිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

සාරනායාගේ ව්‍යාපාරයේ 2026 ජනවාරි මාසයේ වැටුප් ලේඛණය පහත ශේෂයන් උපුටා ගන්නා ලදි

| | රු 000 |
|---|---|
| මූලික වැටුප් | 1 200 |
| දීමණා | 400 |
| EPF සේවක දායකය | 160 |
| EPFසේව්‍යා දායකය | 240 |
| ETF දායකය | 48 |
| ණය වාරික අඩු කිරීම | 100 |

11.2026 ජනවාරි මාසයේ ගෙවිය යුතු ශුද්ධ වැටුප කීයද?

(1) රු 1 440 000
(2) රු 1 052 000
(3) රු 1 340 000
(4) රු 1 100 000
(5) රු 1 320 000

(........)

12.2026 ජනවාරි මාසයට සේවකයන් ව්‍යාපාරය සේවකයන් වෙනුවෙන් දරා ඇති මුළු වියදම කීයද?

I. රු 1 600 000
II. රු 1 888 000
III. රු 1 628 000
IV. රු 1 052 000
V. රු1880000

(........)

- 13 හා 14 ප්‍රශ්න සඳහා පිලිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

සීමිත රංගිරි පොදු සමාගමට අදාලව 2026.03.31 න් අවසන් වසර සඳහා පහත තොරතුරු සපයා ඇත.

| | රු 000 |
|---|---|
| ආපසු එවුම් | 700 |
| ණයට විකුණුම් | 3 500 |
| ණයගැති මුදල් ලැබීම් | 2 100 |
| අයකල පමා පොලී | 40 |
| හාණිකරන අලාභය | 80 |
| පෙර වසරක කපාහල බොල්ණය නැවත ලැබුණා | රු 100 |


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

2025.04.01 දිනට වෙළඳ ලැබිය යුතු දෑ ධාරන අගය රු 900

සමාගම සෑම වසරකම අවසාන වෙළඳ ලැබිය යුතු දෑ ශේෂය මත 10% ක හානිකරන අලාභ සඳහා ඉඩහැරීමක් සිදුකරනු ලබයි.

13.2026.03.31 දිනට වෙළඳ ලැබිය යුතු දෑ වල ධාරන අගය වන්නේ

(1) රු 1 404 000
(2) රු 1 660 000
(3) රු 1 560 000
(4) රු 1 494 000
(5) රු 1 700 000

(........)

14.2026.03.31 න් අවසන් වර්ෂය සඳහා හානිකරන අලාභ ඉඩහැරීම සඳහා ඉඩහැරීම තුලින් ඇතිවනුයේ අධි වෙන් කිරීමක් ද, ඌන වෙන් කිරීමක්ද යන්න වටිනාකම සමග වනුයේ

(1) රු 66 000 ඌන වෙන් කිරීම
(2) රු 66 000 ක අධි වෙන් කිරීම
(3) රු 56 000 ක අධි වෙන් කිරීම
(4) රු 56 000 ක ඌන වෙන් කිරීම
(5) රු 60 000 ක ඌන වෙන් කිරීම

(........)

15.සුධර්මාගේ ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය සකස් කිරීමේදී වැරදීමකින් අවසාන බඩු තොගය අවතක්සේරු වී ඇත. ආදායම් ප්‍රකාශනයේ පහත අයිතමයන්ට සිදු වන බලපෑම වන්නේ

| | විකුණුම් පිරිවැය | ලාභය |
|---|---|---|
| (1) | වෙනස් නොවේ | වැඩි වේ. |
| (2) | අඩු වේ. | අඩු වේ. |
| (3) | වැඩි වේ | වෙනස් නොවේ |
| (4) | වැඩි වේ | අඩු වේ |
| (5) | අඩු වේ | වෙනස් නොවේ. |

(........)

16.ලිට්ල් ලයන් ක්‍රීඩා සමාජය 2023.04.01 යාවජීව සාමාජිකයන් 10 දෙනෙකුගේ දායකත්වයෙන් ආරම්භ කරන ලදි.යාවජීව සාමාජික මුදල් වසර 10 කාලයක් තුල ආදායම්ලෙස හඳුනා ගනියි.2025.04.01 දිනට යාවජීව සාමාජික මුදල් ගිණුමේ ශේෂය රු 160 000

2026.03.31 දිනයේ අවසන් වර්ෂයට ආදායම ලෙස හදුනාගත යුතු යාවජීව සාමාජික මුදල් වටිනාකම වන්නේ

(1) රු 160 000
(2) රු 16 000
(3) රු 20 000
(4) රු 144 000
(5) රු 15 000

(........)

17.සීමිත සුන්දරා සමාගමෙ 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත.

| | රු 000 |
|---|---|
| 2025.04.01 දිනට තොග -පිරිවැය | 90 000 |
| - ශුද්ධ උපලබ්ධි අගය | 80 000 |
| විකුණුම් | 540 000 |
| ගැණුම් | 325 000 |
| තොග විනාශ වීම් | 40 000 |
| 2026.03.31 දිනට තොග - පිරිවැය | 60 000 |
| -ශුද්ධ උපලබ්ධි අගය | 40 000 |

සමාගම අවසන් තොග භෞතිකව ආගණනය කරනු ලබයි.

2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය සහ 2026.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු තොගයේ වටිනාකම වන්නේ

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

| විකුණුම් පිරිවැය | මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු තොග වටිනාකම |
|---|---|
| (1) 325000 | 40 000 |
| (2) 315 000 | 40 000 |
| (3) 305 000 | 40 000 |
| (4) 315 000 | 60 000 |
| (5) 355 000 | 40 000 |

(........)

18. ඉඩම් ක්ෂය නොකිරීමට හේතුවක් ලෙස සැලකිය හැක්කේ
(1) ඉඩම් භාවිත කිරීම නිසා භෞතිකව වැහැරීමක් , ගෙවී යාමක් සිදු නොවන නිසා
(2) ඉඩම්වල අපේක්ෂිත ඵලදායී ජීවකාලය සීමා රහිත වීම නිසා
(3) ඉඩම්වල වටිනාකම් (මිල) නිරන්තරයෙන් වේගයෙන් ඉහල යාම නිසා
(4) ඉඩම් වල භූගෝලීය පිහිටීමත් සමග වටිනාකම වෙනස් වීම නිසා
(5) ඉඩම් වල වටිනාකම පිරිවැය නිවැරදිව තක්සේරු කළ නොහැකි වීම නිසා (........)

19.VAT සඳහා ලියාපදිංචි නොවූ ව්‍යාපාරයක් 2025.04.01 දින VAT රහිත මිල වූ රු 2 500 000 කට යන්ත්‍රයක් මිලදී ගන්නා ලදි.මෙම යන්ත්‍රය මිලට ගැනීමේදී 15% ක VAT ගෙවීමට සිදුවිය.මෙම යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය වසර 05 වන අතර ඵලදායී ජීව කාලය අවසානයේ එහි සුන්බුන් අගය රු 375 000 ක් වේ යැයි ඇස්තමේන්තු කරන ලදි.2026.03.31 දිනට මෙම යන්ත්‍රයේ ධාරන අගය වන්නේ

(1) රු 2 300 000
(2) රු 2 075 000
(3) රු 2 500 000
(4) රු 2 375 000
(5) රු 2 875 000

(........)

20.සමාගමක 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු උපුටා ගෙනඇත.

| | රු 000 |
|---|---|
| මුළු විස්තීරන ආදායම | රු 6 000 |
| වෙනත් විස්තීරන ආදායම | රු 1 500 |
| ආදායම් බද්ද | රු 1 125 |

වර්ෂය තුලදී බැංකු ණය වාරිකය නිසි පරදි ගෙවා ඇති අතර එ තුල ඇතුලත් වූ මුළු පොලිය රු 375 000 කි.සමාගමේ පොළී ආවරණ අනුපාතය කීයද?

I. වාර 12
II. වාර 14
III. වාර 16
IV. වාර 18
V. වාර 20

(........)

21.LKAS - 07 මුදල් ප්‍රවාහ ප්‍රකාශ ප්‍රමිතයට අනුව පහත සඳහන් එක් එක් මුදල් ප්‍රවාහයන් ඇතුලත් කල යුතු ක්‍රියාකාරකම් අනුපිලිවෙලින් දැක්වෙන පිලිතුර තෝරන්න.

A. ලාභාංශ ගෙවීම
B. ණයගැති මුදල් ලැබීම
C. මොටර් රථ විකුණුම්
D. කොටස් නිකුත් කිරීම

(1) ආයෝජන,මෙහෙයුම්,මූල්‍ය,ආයෝජන
(2) මූල්‍ය,මෙහෙයුම්, ,මූල්‍ය, ආයෝජන
(3) මූල්‍ය, ,මෙහෙයුම්, ආයෝජන ,මූල්‍ය
(4) මූල්‍ය,ආයෝජන,මෙහෙයුම්,මූල්‍ය
(5) ආයෝජන,මෙහෙයුම්,මූල්‍ය,ආයෝජන

(........)

PAST PAPERS WIKI



iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources

22.LKAS 37 (ප්‍රතිපාදන,අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම්) ප්‍රමිතයට අනුව පහත කුමන අයිතමය සමාගමක මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන ලෙස හඳුනා ගැනේද?

A. වගකීම් සහතික සඳහා වෙන් කිරීම
B. හානිකරන අලාභ සඳහා ඉඩ හැරීම
C. සේවක වන්දි වෙන් කිරීම
D. සමුච්චිත ක්ෂය

(1) A හා C පමණි
(2) A හා B පමණි
(3) B හා C පමණි
(4) A හා D පමණි
(5) A,B හා C පමණි (........)

23.පහත සඳහන් ප්‍රකාශ අතරින් නිෂ්පාදන පිරිවැය නිවරදිව දැක්වෙන ප්‍රකාශනය වන්නේ

(1) පාරිභෝජන ද්‍රව්‍ය පිරිවැය + ප්‍රාථමික පිරිවැය + නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය
(2) ප්‍රාථමික පිරිවැය + පොදුකාර්ය පිරිවැය
(3) සෘජු ද්‍රව්‍ය පිරිවැය + සෘජු ශ්‍රම පිරිවැය + සෘජු වෙනත් වියදම්
(4) සෘජු ද්‍රව්‍ය පිරිවැය +ප්‍රාථමික පිරිවැය + නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය
(5) ප්‍රාථමික පිරිවැය + පොදුකාර්ය පිරිවැය -නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය (........)

- 24 හා 25 ප්‍රශ්නවලට පිලිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

සීමිත අමාලි පොදු සමාගමේ 2026.03.31 න් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත.

| විස්තරය | රු 000 |
|---|---|
| විකුණුම් | 8 200 |
| දළ ලාභය | 3 200 |
| වෙනත් ආදායම් | 400 |
| බෙදාහැරීම්,පරිපාලන,මූල්‍ය වියදම්වල එකතුව | 1 400 |
| බදු වියදම | 200 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය-ඉඩම් | 800 |
| ප්‍රත්‍යාගණන ඌනතාවය -කාර්යාල උපකරන | 200 |
| ගෙවූ ලාභාංශ-සාමාන්‍ය කොටස් | 200 |

අතිරේක තොරතුරු

I. 2025.04.01 දිනට රදවාගත් ඉපයුම් රු 1 100 000 ක් විය.
II. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රථම වතාවට ඉඩම් ප්‍රත්‍යාගණනය කල අතර එහිදි වාර්තා කල ඌනතාවය රු 800 000 ක් විය.
III. ප්‍රවර්තන වර්ෂයේ කර්යාල උපකරන ප්‍රථම වතාවට ප්‍රත්‍යාගනනය කර ඇත.

24.LKAS 01 මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කිරීම ප්‍රමිතයට අනුව 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ අලාභ හෝ වෙනත් විස්තීරන ආදායම් ප්‍රකාශනයේ හදුනාගත යුතු මුළු විස්තීරන ආදායම හා වෙනත් විස්තීරන ආදායම කොපමනද?

| | මුළු විස්තීරන ආදායම (රු 000) | විස්තීරන ආදායම (රු 000) |
|---|---|---|
| (1) | 2 700 | 300 |
| (2) | 2 700 | 700 |
| (3) | 2 900 | 700 |
| (4) | 2 900 | 300 |
| (5) | 3 200 | 800 |

(........)


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

25.2026.03.31 දිනට රඳවාගත් ඉපයුම කොපමණද?

(1) රු 3 800 000
(2) රු 3 500 000
(3) රු 3 300 000
(4) රු 2 400 000
(5) රු 4 000 000

(........)

26.සෙල්ලම් කාරයක් නිපදවන නිෂ්පාදන සමාගමක භාවිතා කරන අමුද්‍රව්‍ය අයිතමයකට අදාල දත්ත පහත වේ.

| | |
|---|---|
| අවම පාරිභෝජනය (දිනකට ඒකක) | 3 600 |
| සාමාන්‍ය පාරිභෝජනය (දිනකට ඒකක) | 4 000 |
| අවම ඇණවුම් කාලය (දින) | 3 |
| සාමාන්‍ය ඇණවුම් කාලය (දින) | 4 |
| උපරිම තොග මට්ටම (ඒකක) | 24 000 |

මෙම අමුද්‍රව්‍ය අයිතමයට අදාළ යලි ඇණවුම් මට්ටම හා යලි ඇණවුම් ප්‍රමාණය පිළිවෙලින් ඒකක

| යලි ඇනවුම් මට්ටම | යලි ඇනවුම් ප්‍රමාණය |
|---|---|
| (1) 21 000 | 9 800 |
| (2) 22 000 | 10 800 |
| (3) 20 000 | 8 800 |
| (4) 18 000 | 7 500 |
| (5) 15 000 | 3 800 |

(........)

27.පොදුකාර්ය පිරිවැය බෙදාහැරීමේ ක්‍රියාපිලිවෙල අනුපිලිවෙලින් දක්වා ඇති පිලිතුරු කුමක්ද?

A. පොදුකාර්ය පිරිවැය ප්‍රතිපාදනය කිරීම
B. පොදුකාර්ය පිරිවැය විභජනය කිරීම
C. පොදුකාර්ය පිරිවැය, පිරිවැය ඒකකවලට අන්තර්ග්‍රහනය කිරීම
D. පොදුකාර්ය පිරිවැය රුස් කිරීම

(1) A,B,C හා D
(2) A,C,B හා D
(3) D,A,B හා C
(4) D,B,A හා C
(5) D,A,C හා B

(........)

28.නිෂ්පාදන ව්‍යාපාරයක 2026 ජනවාරි මාසයේ ස්ථාවර පිරිවැය රු 180 000 ක් වන අතර සමච්ඡේද අවස්ථාවේ දී විචල්‍ය පිරිවැය රු 72 000 ක් වේ.

දායක විකුණුම් අනුපාතය වන්නේ

(1) 40%
(2) 45%
(3) 50%
(4) 70%
(5) 60%

(........)

29. "X" නමැති භාණ්ඩයක් නිපදවන ව්‍යාපාරයකට අදාලව තොරතුරු පහත වේ.

| | |
|---|---|
| සමච්ඡේදන ලක්ෂය (ඒකක) | 4 000 |
| ඒකක විචල්‍ය පිරිවැය | රු 60 |
| දායක විකුණුම් අනුපාතය | 40% |

මෙම භාණ්ඩයෙන් ඒකක 4 500 ක් අලවි කරන්නේ නම් අපේක්ෂිත විකුනුම් වටිනාකම සහ අපේක්ෂිත ලාභය සොයන්න.

| අපේක්ෂිත විකුණුම් ආදායම | අපේක්ෂිත ලාභය |
|---|---|
| (1) රු 400 000 | රු 12 000 |
| (2) රු 270 000 | රු 20 000 |
| (3) රු 450 000 | රු 20 000 |
| (4) රු 425 000 | රු 15 000 |
| (5) රු 390 000 | රු 15 000 |

(........)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

30.ප්‍රාග්ධන ආයෝජන ව්‍යාපෘති ඇගයීම සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය වේද?

A. පිළිගෙවුම් කාලය ගණනය කිරීමේදී මුදලේ කාලීන අගය සැලකිල්ලට ගනියි.
B. දැනටමත් දරා අවසන් පිරිවැය මුදල් ප්‍රවාහයන් ලෙස සැලකීම.
C. පොලී මුදල් ප්‍රවාහයට ඇතුලත් කර නොගනියි.

(1.)A පමණි (2.)B පමණි (3.)A හා C පමණි (4.)C පමණි (5.)B හා C පමණි (........)

ප්‍රශ්ණ අංක 31 සිට 50 තෙක් ප්‍රශ්ණවලට කෙටි පිළිතුරු තිත් ඉරි මත ලියන්න.

31.පහත දැක්වෙන ලෙජර් ගිණුම් කුමන ගිණුම්කරන මූලිකාංගයට අයත් වේද?

I. ගැනිලි ගිණුම ..............................
II. සේවක වන්දි ගිණුම ..............................
III. ආපසු එවුම් ගිණුම ..............................
IV. නොයිපයු ආදායම් ගිණුම ..............................

32.මූල්‍ය වාර්තාකරණයේ සංකල්පණාත්මක රාමුවට අනුව පහත වගන්ති සම්පූර්ණ කරන්න

A. මූල්‍ය තොරතුරුවල මූලික ගුණාත්මක ගතිලක්ෂණ වන්නේ අදාල බව හා .............................. යි.
B. අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ආර්ථික සම්පත් පවරා දීම සම්බන්ධයෙන් ව්‍යාපාර ඒකකය සතු.............................. වගකීමක් ලෙස හැඳින්වේ.
C. සංකල්පණාත්මක රාමුවට අනුව මූලිකාංග මැනීම ඓතිහාසික පිරිවැය පදනම් මිනුම්කරණය හා ..............................අගය පදනම් මිණුම්කරණය ලෙස ප්‍රධාන කොටස් දෙකකට බෙදේ.
D. සංකල්පණාත්මක රාමුවට අනුව පදනම් උපකල්පනය ලෙස.............................. හඳුනා ගනියි.

33.ශාන්තිගේ ව්‍යාපාරයේ 2026.01.01 දිනට සුළු මුදල් භාරකරු අත ඉතිරි මුදල රු 2 700 ක් විය.මසකට අග්‍රිමය ප්‍රමාණවත් නොවන බැවින් 2026.01.01 දින සිට තවත් රු 5 000 කින් අග්‍රිමය ඉහල නැන්වූ අතර එදිනම රු 12 300 ක මුදලක් අග්‍රිමය ප්‍රතිපූර්ණය සඳහා සුළු මුදල් භාරකරුට ලැබුණි.

I. අග්‍රිමය ඉහල දැමීමට පෙර මාසයක අග්‍රිමය කොපමණද?..............................
II. අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීමට අදාල ජර්නල් සටහන් ලියන්න.

| | හර | බැර |
|---|---|---|
| | | |

34. නිෂ්පාදන ව්‍යාපාරයක 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු ඔබට සපයයි.

| | රු 000 |
|---|---|
| පාරිභෝජන ද්‍රව්‍ය පිරිවැය | 1 800 |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 500 |
| සෘජු ශ්‍රමය | 300 |
| පුරස්කාර | 100 |
| නොනිමි තොගය අඩුවීම (නිෂ්පාදන පිරිවැයට අගය කල) | 50 |
| 2026.03.31 නිමි තොගය | 650 |
| 2025.04.01 නිමි තොගය | 450 |

2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය වන්නේ: ..............................

35. 2025.04.01 දින සාමාජිකයන් 30 දෙනෙකුගේ මූලිකත්වයෙන් ක්‍රීඩා සමාජයක් ආරම්භ කරන ලදී.2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍රීඩා සමාජයේ මුළු ආදායම රු 1 340 000 ක් වූ අතර මුළු වියදම රු 820 000 ක් විය. වර්ෂය තුළ ක්‍රීඩාගාරයක් තැනීම සඳහා විශේෂ අරමුදලක් ආරම්භ කරන ලද අතර, ඒ සඳහා රු 2 000 000 ක මුදල් පරිත්‍යාගයක් 2026.03.31 දින ලැබී ඇත. එයින් ක්‍රීඩාගාරය ඉදිකිරීම සඳහා 40% ක මුදලක් භාවිතා කරන ලදී. කෙසේ වෙතත් වර්ෂය තුළ ලද රු 150 000 ක සාමාන්‍ය පරිත්‍යාග ගිණුම්ගත කිරීම මඟහැරී ඇත.


iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers · Model Answers · Study Resources
නවවන පිටුව බලන්න

2026.03.31 දිනට ක්‍රීඩා සමාජයේ සමුච්චිත අරමුදල වන්නේ රු

.............................................................................................................................................

36. .SLFRS 15 ගණුදෙනුකරුවන් සමග ඇතිවන ගිවිසුම් වලින් ඇතිවන අයභාරය ප්‍රමිතයට අනුව

I. අයභාරය හඳුනාගත යුතු අවස්ථාව වන්නේ

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

II. ගණුදෙනුවෙහි මිල යනු

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

37. හවුල් ව්‍යාපාරයකට අදාල පහත සඳහන් ප්‍රකාශ සත්‍ය නම් (T) අසත්‍ය නම් (F) ද යන්න සඳහන් කරන්න.

| | | සත්‍ය/අසත්‍යයි |
|---|---|---|
| A. | හවුල් ව්‍යාපාරයක ගිවිසුමක් ඇති විටකදී 1890 හවුල් ව්‍යාපාර ආඥා . පනතේ නීතිමය විධිවිධාන කිසිවිටකත් එම ව්‍යාපාරයට බලනොපායි | ........................ |
| B. | හවුල් ව්‍යාපාරයක ස්ථාවර හා විචල්‍ය හිමිකම් වාර්තා කිරීමට වෙන වෙනම හිමිකම් ගිණුම් පවත්වාගෙන යයි. | ........................ |
| C. | හවුල් ව්‍යාපාරයට හවුල්කරුවෙකු ණයක් සපයා ඇති විට ඊට අදාළ පොළිය ආදායම් ප්‍රකාශනයේ වියදම් තුල වාර්තා කල යුතුය. | ........................ |
| D. | ව්‍යාපාරය වෙනුවෙන් හවුල්කරුවන් දරන්නා වූ වියදම් අමතර ප්‍රාග්ධනය ලෙස සලකිය යුතු බවට හවුල් ආඥා පනතේ 24 වන වගන්තියේ සඳහන් වේ. | ........................ |

38. නිදුක හා ධනුක විසින් පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයේ 2026.03.31 න් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ විසර්ජන ප්‍රකාශයෙන් පහත තොරතුරු උපුටා ගෙන ඇත.

| | | රු 000 |
|---|---|---|
| හවුල් වේතන | නිදුක | 480 |
| | ධනුක | 360 |
| අලාභ කොටස් | නිදුක | 108 |
| | ධනුක | 072 |

හවුල් ව්‍යාපාරයේ ලාභ අලාභ ගණනය කිරීමේදී රු 420 000 ක විකුණුම් ඉංවොයිසියක් මඟහැරී ඇති බව පසුව අණාවරනය විය.

I. 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිවරදි ශුද්ධ ලාභය රු ..............................................................

II. 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ධනුකගේ ලාභ කොටස රු ..............................................................

39. සීමිත අයිරිෂ් පොදු සමාගමේ පහත තොරතුරු ඔබට සපයයි.

| | 2026.03.31 (රු 000) | 2025.04.01 (රු 000) |
|---|---|---|
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධණය | 24 000 | 20 000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 1 300 | 300 |
| රඳවාගත් ඉපයුම් | 5 200 | 6 700 |

වර්ෂය තුල ඉඩම් ප්‍රථම වතාවට ප්‍රත්‍යාගණනය කල අතර රු 1 400 000 රඳවාගත් ඉපයුම් භාවිතා කරමින් සංචිත ප්‍රාග්ධනිත කර ඇත.වර්ෂය තුල ලාභාංශ ලෙස රු 990 000 ක් ගෙවා ඇත.

I. 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාලච්ඡේදයේ ලාභය රු ..............................................................

II. 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම රු ..............................................................

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

40. සමාගමක 2026 මාර්තු මාසයට අදාල පහත තොරතුරු ඔබට සපයා ඇත. සමාගම තොග නිකුත් කිරීම සඳහා පෙර පිවිසි පෙර පිට (FIFO) ක්‍රමය භාවිතා කරයි.

| දිනය | විස්තරය | ප්‍රමාණය (ඒකක) | ඒකක පිරිවැය |
|---|---|---|---|
| 2026.03.01 | ශේෂය | 1 000 | ? |
| 2026.03.10 | මිලට ගැනීම | 2 000 | 70 |
| 2026.03.25 | විකුණුම් | 1500 | ? |

2026.03.01 දිනට පැවති තොගය
2026.02.25 දින මිලට ගත් තොග වලින් ඒකක 400 ක් ඉතිරිව ඇත.ඒකකයක් රු 50 යි.
2026.02.27 දින මිලට ගත් තොග වලින් ඒකක 600 ක් ඉතිරිව ඇත.ඒකකයක් රු 60 යි.

I. විකුණුම් පිරිවැය රු ............................................................

II. 2026.03.31 දිනට තොගය රු ............................................................

41.LKAS - 08 ගිණුම්කරන ප්‍රතිපත්ති,ගිණුම්කරන ඇස්තමේන්තු වෙනස්වීම් හා වැරදි ප්‍රමිතයට අනුව පහත එක් එක් අවස්ථාව ගිණුම්කරන ඇස්තමේන්තු වෙනස්වීමක්ද,ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීමක් ද,යන්න සඳහන් කරන්න.

| | | ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම්/ගිණුම්කරන ඇස්තමේන්තු වෙනස්වීම් |
|---|---|---|
| I. | පෙර පිවිසි පෙර පිට (FIFO) ක්‍රමයේ සිට භරිත සාමාන්‍ය පිරිවැය (WAC) ක්‍රමයට තොග අගය කිරීමේ ක්‍රමය වෙනස් කිරීම | .............................. |
| II. | පිරිවැය ආකෘතියේ සිට ප්‍රත්‍යාගණන ආකෘතියට දේපල පිරියත හා උපකරන මිනුම්කිරීමේ ක්‍රමය වෙනස් වීම | .............................. |
| III. | වගකීම් සහතික සඳහා වෙන් කිරීම 2% සිට 5% දක්වා වැඩි කිරීම | .............................. |
| IV. | දේපල පිරියත හා උපකරනවල ක්ෂය ක්‍රමය සරල මාර්ග ක්‍රමයේ සිට හීනවන ශේෂක්‍රමයට වෙනස් වීම. | .............................. |

42. සීමිත නිෂ්මි නිෂ්පාදන සමාගම නිෂ්පාදනයට ගනු ලබන අමුද්‍රව්‍යකට අදාල තොරතුරු පහත දී ඇත.

ඒකකයක් රඳවා ගැනීමේ පිරිවැය — රු 10
වාර්ෂික ඉල්ලුම — ඒකක 12 000
එක් ඇණවුමක් ඒකක 3 000 ක් වේ නම් වාර්ෂික ඇණවුම් පිරිවැය රු 60 000 යි.

I. ආර්ථික ඇණවුම් ප්‍රමාණය රු (EOQ) ............................................................

II. වරකට ආර්ථික ඇණවුම් ප්‍රමාණය ඇණවුම් කරන්නේ නම් වාර්ෂික ඇණවුම් පිරිවැය රු ............................................................

43. 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත සාරංග පොදු සමාගමේ තොරතුරු පහත දී ඇත.

| | රු 000 |
|---|---|
| විකුණුම් | රු 12 000 |
| විකුණුම් පිරිවැය | රු 7 500 |
| බදු පසුලාභය | රු 1 500 |
| ලාභාංශ ගෙවීම | රු 600 |
| සාමාන්‍ය කොටස් ගණන | 400 000 |

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

ඉහත තොරතුරු අනුව

I. දළ ලාභ අනුපාතය ..................................................

II. ශුද්ධ ලාභ අනුපාතය ..................................................

III. කොටසකට ලාභාංශ ..................................................

IV. කොටසට ඉපයුමක් ..................................................

44. භාණ්ඩ නිපදවන ආයතනයක පහත අයවැයගත තොරතුරු ඔබට ලබා දී ඇත.

ඒකකයක සෘජුශ්‍රම පිරිවැය (පැයකට රු 120 බැගින්) රු 480

ඒකකයට අන්තර්ග්‍රහනය කළ යුතු නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය රු 600

නිෂ්පාදන පොදුකාර්ය සෘජු ශ්‍රම පැය මත අන්තර්ග්‍රහණය කෙරේ. කාලච්ඡේදයේ භාණ්ඩයෙන් ඒකක 12 000 ක් නිපදවීමට අපේක්ෂා කෙරේ.

I. පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහන අනුපාතය ..................................................

II. අයවැය ගත නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය රු ..................................................

45. සමාගමක් තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරයි. ඊට අදාළ තොරතුරු පහත වේ.

| නිෂ්පාදිත ඒකක ගණන | මුළු පිරිවැය (රු) |
|---|---|
| 1 000 | 1 200 000 |
| 1 500 | 1 400 000 |

ඒකකයක විකුණුම් මිල රු 600 ක් වේ.

I. මුළු ස්ථාවර වියදම රු

..................................................

II. සමච්ඡේද ලක්ෂය ඒකක

..................................................

46.පිරිවැය වර්ගීකරනයට අදාළව පහත ප්‍රකාශ සම්පූර්ණ කරන්න.

I. තොග අගය කිරීම සඳහා පිරිවැය .................................................. සහ .................................................. ලෙස වර්ග කෙරේ.

II. පාලන කාර්යය සඳහා පිරිවැය .................................................. සහ.................................................. ලෙස වර්ග කෙරේ.

47.සීමිත ආලෝකා පොදු සමාගමේ 2026.03.31 දිනෙන් අවසන් වසර සඳහා පිළියෙල කල මූල්‍ය ප්‍රකාශන 2026.06.30 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදි.මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීම 2026.07.05 දින සිදු කරන ලදි. LKAS 10 -වාර්තා කරන කාලච්ඡේදයට පසු සිදුවීම් ප්‍රමිතයට අනුව පහත එක් එක් සිදුවීම ගලපන සිදුවීමක්ද, නොගලපන සිදුවීමක්ද, යන්න සටහන් කරන්න.

| | | ගලපන සිද්ධි/නොගලපන සිද්ධි |
|---|---|---|
| I. | 2026.03.31 දිනට රු 200 000 ක් වූ ණයගැතියෙකු අධිකරණ තීන්දුවක් මත 2026.05.15 දින භාණ්ඩකරන අලාභ ලෙස ලියා හැරීම. | .................................... |
| II. | රු 5 000 000 ක ලාභාංශයක් සාමාන්‍ය කොටස් හිමියන්ට යෝජනා කිරීම | .................................... |
| III. | 2026.03.31 දිනට තිබුනු රු 1 000 000 ක් පිරිවැය වූ තොගයක් රු 800 000 කට රු 50 000 ක වියදමක් දරා 2026.06.10 දින විකිනීම. | .................................... |
| IV. | 2026.06.10 දිනට තිබුනු රු 1 800 000 පිරිවැය වූ පරිගණක, 2026.04.15 දින ඇති වූ ගින්නකින් හානි වී රු 700 000 ක අලාභයක් සිදුවීම. | .................................... |

දොළොස්වන පිටුව බලන්න



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

48.යිමිත රිෂ්මි පොදු සමාගම 2019.04.01 දින රු 4 000 000 කට යන්ත්‍රයක් මිලටගත් අතර,එය වාර්ෂිකව 10% බැගින් ක්ෂය කරනු ලබයි.2025.04.01 දින රු 900 000 ක වියදමක් දරා යන්ත්‍රය නවීකරනය කල අතර,ඒ හේතුවෙන් යන්ත්‍රයේ ඵලදායි ජීව කාලය වසරකින් ඉහල යන ලදී.

I. 2026.03.31 දිනෙන් අවසන් වර්ෂයේ යන්ත්‍ර ක්ෂය රු ..............................

II. 2026.03.31 දිනට යන්ත්‍රයේ ධාරන අගය රු ..............................

49.ද්‍රව්‍ය පිරිවැය පාලනයේ පහත කාර්යයන් තහවුරු කිරීමට අදාල ලියවිලි නම් කරන්න.

I. භාණ්ඩ මිලට ගන්නා ලෙස ගැණුම් කලමණාරුගෙන් ඉල්ලුම් කිරීම ..............................

II. සැපයුම්කරු භාණ්ඩ තොගය සමග ආයතනයේ භාණ්ඩ භාර ගැනීමේ අංශය වෙත යොමු කරන ලියවිල්ල ..............................

III. සැපයුම්කරුගෙන් භාණ්ඩ ඇනවුම් කිරීම ..............................

IV. ගබඩාවෙන් නිෂ්පාදන අංශයට ද්‍රව්‍ය නිකුත් කිරීම ..............................

50. . සමාගමක් විසින් සලකා බලන ව්‍යාපෘතියකට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | රු 000 |
|---|---|
| මූලික ආයෝජනය (රු) | රු 2 400 |
| ඵලදායි ජීව කාලය (වසර) | 05 |
| සුන්බුන් අගය (රු) | රු 400 |
| වාර්ෂික මුදල් ගලා ඒම (රු) | රු 1 200 |
| වාර්ෂික පිරිවැය (ක්ෂය ද ඇතුළුව) | රු 700 |

මෙම ව්‍යාපෘතියේ පිළිගෙවුම් කාලය

..............................



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# අ.පො.ස (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2026

| ගිණුම්කරණය II | 33 | S | II | 13 ශ්‍රේණිය | පැය තුනයි |
|---|---|---|---|---|---|

අමතර කියවීම් කාලය -මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්ණ පත්‍රය කියවා ප්‍රශ්ණ තෝරා ගැනීමටත්
පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්ණ සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

වැඩසටහන් සම්පාදනය කල නොහැකි සාමාන්‍ය ගණක යන්ත්‍ර භාවිතා කිරිමට අවසර ලැබේ.

උපදෙස් - පළමු හා දෙවන ප්‍රශ්ණය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න
- සෑම ප්‍රශ්ණයකටම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න
- අදාළ පෙර වැඩ පිලිතුරු පත්‍රය සමග අමුණන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 200 ක් හිමි වේ.

01. සීමිත රන්සර පොදු සමාගමේ 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ කෙටුම්පත් ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තිරන ආදායම් ප්‍රකාශනය පහත දැක්වෙයි.

සීමිත රන්සර පොදු සමාගම
2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තිරන ආදායම් ප්‍රකාශනය (රු 000)

| | | | |
|---|---|---|---|
| විකුණුම් | | | 91 800 |
| විකුණුම් පිරිවැය | | | (57 500) |
| දළ ලාභය | | | 34 300 |
| වෙනත් ආදායම් | | | - |
| බෙදා හැරීමේ වියදම් | | 8 900 | |
| පරිපාලන වියදම් | | 11 100 | |
| වෙනත් වියදම් | | 1 812 | |
| මූල්‍ය වියදම් | | 1 000 | (22 812) |
| බදු පෙර ලාභය | 01 | | 11 488 |
| ආදායම් බද්ද | 02 | | (2 872) |
| කාලච්ඡේදයේ ලාභය | | | 8 616 |
| වෙනත් විස්තිරන ආදායම | | | - |
| මුළු විස්තිරණ ආදායම | | | 8 616 |

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

සටහන් අංක 02

බදු පෙර ලාභය ගණනය කිරීමේ දී පහත වියදම් අඩුකර ඇත.

| | රු 000 |
|---|---|
| අධ්‍යක්ෂ ගාස්තුව | 500 |
| කල්බදු පොලිය | 1 000 |
| විගණන ගාස්තු | 260 |
| EPF වියදම් | 600 |
| ETF වියදම් | 120 |

මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ දී පහත ගැලපීම් සිදුකර නොමැති බව අනාවරනය විය.

I. 2026/03/31 දිනට තොග පහත පරිදි වේ.

| | පිරිවැය (රු 000) | ශුද්ධ උපලබ්ධි අගය (රු 000) |
|---|---|---|
| ව්‍යාපාරයේ ගබඩාවේ පැවති තොගය | 1 500 | 1 460 |
| විකිණීමේ හෝ ආපසු එවීමේ පදනමට ගණුදෙනුකරුවන් වෙත යවා ඉතිරිව ඇති භාණ්ඩ තොගය(මෙම තොගය 2026.04.30 දින ආපසු එවීමේ කාල සීමාව ඉකුත් වේ) | 400 | 430 |

මූල්‍ය ප්‍රකාශණ වල 2026/03/31 දිනට අවසාන තොගය ලෙස සටහන් කර ඇත්තේ රු 1 500 000 කි.

II. විකුණුම් හා ගැනුම් තුළ 8% ක VAT ඇතුළත්ව ඇත. සමාගම VAT සඳහා ලියාපදිංචි වී ඇති අතර 2026/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා VAT සහිත ගැනුම් වටිනාකම රු 54 000 000 ක් වේ.

III. 2025/04/01 දින කල්බදු ක්‍රමයට මෝටර් රථයක් මිලදී ගත් අතර ඊට අදාල තොරතුරු පහත වේ.

| | |
|---|---|
| මූලික ගෙවීම | රු 1 000 000 |
| අනෙකුත් ඍජු පිරිවැය | රු 500 000 |
| යන්ත්‍රයේ ඵලදායි ජීව කාලය | වසර 05 |
| කල්බදු කාලය | වසර 04 |

2026/03/31 දින සිට සෑම වර්ෂයකම 03/31 දිනට වාර්ෂික කල්බදු වාරිකය ලෙස රු 1 000 000 ක් ගෙවිය යුතුය.2026/03/31 දින පළමුවන කල්බදු වාරිකය මුදලින් ගෙවූ අතර එය මුදල් ගිණුමට බැර කර කල්බදු පොළී ගිණුමට හර කිරීම හැර කල්බදු සම්බන්ධයෙන් කිසිදු ගැලපීමක් සිදු කර නොමැත.කල්බදු ගෙවීම්වල වර්තමාන අගය රු 3 100 000 කි.2025/26 සහ 2026/27 වර්ෂවලට අදාල වාර්ෂික කල්බදු වාරිකය තුල ඇතුලත් පොළිය පිලිවෙලින් රු 400 000 ක් හා 280 000 ක් වේ.කල්බදු කාලය අවසානයේ දී වත්කමේ අයිතිය කල්බදු ගැණුම්කරුට මාරු වේ.

IV. 2025/04/01 දිනට සමාගමේ දේපල පිරියත හා උපකරන සහ ඒවායේ සමුච්චිත ක්ෂය වල සංයුතිය පහත වේ.දේපල පිරියත හා උපකරන සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව ක්ෂය කල යුතු අතර 2025/26 වර්ෂයට අදාලව ක්ෂය ගලපා නොමැත.

| වත්කම (රු 000) | පිරිවැය/ප්‍රත්‍යාගණන අගය (රු 000) | සමුච්චිත ක්ෂය (රු 000) | වාර්ෂික ක්ෂය ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| ඉඩම් | 10 000 | - | - |
| ගොඩනැගිලි | 38 000 | 15 200 | 10% |
| මෝටර් රථ | 28 000 | 8 400 | 10% |
| කාර්යාල උපකරන | 8 000 | 2 000 | 5% |
| එකතුව | 84 000 | 25 400 | - |

මෝටර් රථ භාණ්ඩ බෙදාහැරීම සඳහා භාවිතා තරන අතර අනෙකුත් දේපල පිරියත හා උපකරන අයිතම පරිපාලන කටයුතු වෙනුවෙන් භාවිතා කෙරේ.

V. ගොඩනැගිලි 2026/03/31 දින දෙවන වරට රු 20 500 000 කට ප්‍රත්‍යාගණනය කල අතර වසර තුනකට පෙර සිදුකල ප්‍රත්‍යාගණනයෙන් රු 800 000 ක ප්‍රත්‍යාගණන අලාභයක් සිදු වී ඇත.


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
තෙවන පිටුව බලන්න

VI. පිරිවැය රු 16 200 000 ක් සහ 2025.04.01 දිනට රු 4 860 000 ක් සමුච්චිත ක්ෂය වූ මෝටර් රථයක් 2025/04/01 දින රු 12 000 000 කට විකුණන ලදි.ලද මුදල මුදල් ගිණුමට නිවරදිව සටහන් කර ඇති අතර මෝටර් රථ ගිණුමට බැර කර ඇත.ඊට අදාලව වෙනත් කිසිදු ගැලපීමක් සිදු කර නොමැත.

VII. පරිපාලන වියදම් වල ඇතුළත්ව ඇති සේවක වැටුප් වල අඩංගුව ඇත්තේ ගිණුම් වර්ෂයේ පළමු මාස 11 තුළ ගෙවූ වැටුප් වියදම් පමණක් වේ.2026 මාර්තු මාසයට අදාල ශුද්ධ වැටුප රු 90 000 ක් 2026/04/10 දින ගෙවා ඇත.සේවක අර්ථ සාධක අරමුදල (EPF) සඳහා සේව්‍ය හා සේවක දායකයන් පිලිවෙලින් 15% ක් හා 10% ක් වේ.සේවක භාරකාර අරමුදල (ETF) සඳහා දායකය 3% කි.දළ වැටුප මත EPF හා ETF ගැලපීම් සිදු කරන අතර EPF හැර වෙනත් කිසිදු අඩු කිරීමක් වැටුපෙන් සිදු නොකෙරේ. සෑම මසකම සේවක වැටුප් ,EPF හා ETF ඊට පසු මාසයේ 10 වන දින ගෙවා අවසන් කරන ලදි.

VIII. ප්‍රවර්තන වර්ෂයේ ආදායම් බද්ද බදු පෙර ලාභයෙන් $\frac{1}{4}$ ලෙස ඇස්තමේන්තු කර ඇත.මුදලින් වර්ෂය තුල ගෙවා ඇති ආදායම් බදු ගෙවීම් පහත වේ.

| | |
|---|---|
| 2024/25 වර්ෂය සඳහා | 820 000 |
| 2025/26 වර්ෂය සඳහා | 1 100 000 |

2024/25 වර්ෂයේ අවසන් කාර්තුවේ අදාල සියළුම බදු මුදල් ගෙවා අවසන් වී ඇත.මුදලින් ගෙවූ ආදායම් බදු පරිපාලන වියදම් වලට හර කිරීම හා මුදල් ගිණුම බැර කිරීම හැර වෙනත් ගැලපීමක් සිදු කර නොමැත.

IX. සමාගම වගකීම් සහතික සහිතව භාණ්ඩ අලෙවි කරනු ලබයි.2026/03/31 දිනට විකුණුම් මත 1% ක වගකීම් සහතික සඳහා ප්‍රතිපාදනක් සිදු කල යුතුය.

X. 2025/04/01 දිනට සමාගමේ හිමිකම් පහත පරිදි වේ.

| | |
|---|---|
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | රු 80 000 000 |
| පොදු සංචිතය | රු 8 000 000 |
| රඳවාගත් ඉපයුම් | රු 5 000 000 |

වර්ෂය තුල එකක් රු 100 ක් වූ සාමාන්‍ය කොටස් 10 000 ක් පොදු සංචිත ප්‍රාග්ධනිත කරමින් නිකුත් කර ඇතත් ඒ පිලිබඳව අදාල ගැලපීම් සිදු කර නොමැත.

XI. වර්ෂය තුල රු 1 588 000 ක අතුරු ලාභාංශ ගෙවා ඇත.එය නිවරදිව සටහන් කර ඇත.

2026/03/31 දිනට ඉහත ගැලපීම් සිදු කිරීමට පෙර පහත ශේෂයන් උපුටාගෙන ඇත.

| | |
|---|---|
| වෙළඳ ලැබිය යුතු දෑ | රු 1 600 000 |
| මුදල් ශේෂය | රු 43 120 000 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | රු 850 000 |
| ආදායම් බදු වෙන් කිරීම | රු 870 000 |

අවශ්‍ය වන්නේ

ඉහත ගැලපීම් සැලකිල්ලට ගැනීමෙන් පසුව LKAS 01 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතියට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත රත්සර පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන්ද සහිතව) පිලියල කරන්න.

1. 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරන ආදාය
2. 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය
3. 2026.03.31දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(ලකුණු 40)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

02.(අ).සිමිත ධනුක සමාගම නිමවුම් හා එකලස් ලෙස නිෂ්පාදන දෙපාර්තමේන්තු 2 ක්ද,ගබඩා කටයුතු සඳහා ගබඩා අංශය ලෙස සේවා දෙපාර්තමේන්තුවක්ද ඇත.ඊට අදාල තොරතුරු ඔබට සපයා ඇත.

| විස්තරය | නිමවුම් | එකලස් | ගබඩා |
|---|---|---|---|
| වක්‍ර ශ්‍රමය | 46 000 | 40 000 | 7 000 |
| වක්‍ර ද්‍රව්‍ය | 38 000 | 36 000 | 18 000 |
| සේවක සුභසාධක වියදම් | 15 000 | 11 000 | 9 000 |
| භූමි ප්‍රමාණය (වර්ගමීටර්) | 3 200 | 2 400 | 1 600 |
| ගොඩනැගිලි පිරිවැය (රු) | 1 200 000 | 1 000 000 | 600 000 |
| යන්ත්‍ර පිරිවැය (රු) | 800 000 | 500 000 | 300 000 |
| දුරකථන පැය | 800 | 600 | 500 |
| අයවැය ගත යන්ත්‍ර පැය | 2 400 | 2 100 | - |
| සත්‍ය යන්ත්‍ර පැය | 2 700 | 4 150 | - |
| අයවැයගත සෘජු ශ්‍රම පැය | 2 200 | 1 100 | - |
| සත්‍ය ශ්‍රම පැය | 2 000 | 1 400 | - |

අතිරේක තොරතුරු

I. අනෙකුත් අයවැයගත පොදුකාර්ය පිරිවැය පහත පරිදි වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි ක්ෂය | රු 70 000 |
| යන්ත්‍ර ක්ෂය | රු 112 000 |
| වරිපනම් | රු 45 000 |
| දුරකථන වියදම් | රු 38 000 |

II. නිමවුම් දෙපාර්තමේන්තුව සෘජු ශ්‍රම පැය පදනම මතද,එකලස් දෙපාර්තමේන්තුව යන්ත්‍ර පැය පදනම මතද,පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහනය කරයි.

III. ගබඩා දෙපාර්තමේන්තුව විසින් නිමවුම් දෙපාර්තමේන්තුවට ගබඩා අධියාචනා පත්‍ර 60 ක්ද,එකලස් දෙපාර්තමේන්තුවට අධියාචනා පත්‍ර 40 ක්ද, නිකුත් කර ඇත.

IV. මෙම ව්‍යාපාරය A හා B ලෙස භාණ්ඩ වර්ග දෙකක් නිපදවන අතර පහත තොරතුරු එම භාණ්ඩවලට අදාල වේ.

| | A භාණ්ඩය | B භාණ්ඩය |
|---|---|---|
| සෘජු ශ්‍රමය | රු 700 | රු 900 |
| සෘජු ද්‍රව්‍ය | රු 300 | රු 200 |
| අයවැයගත සෘජු ශ්‍රම පැය ගණන | පැය 2 | පැය 3 |
| අයවැයගත යන්ත්‍ර පැය ගණන | පැය 4 | පැය 2.5 |

අවශ්‍ය වන්නේ

1. විභජන පදනම පැහැදිලිව දක්වමින් පොදුකාර්ය පිරිවැය විභජන පත්‍රිකාව පිලියෙල කිරීම
2. එකලස් හා නිමවුම් දෙපාර්තමේන්තු සඳහා පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහන අනුපාත පිලියෙල කිරීම
3. A හා B භාණ්ඩවල මුළු පිරිවැය වෙන වෙනම ගණනය කිරීම
4. A ඒකකයක විකුණුම් මිල රු 1 900 ක්ද,B ඒකකයක විකුණුම් මිල රු 2 000 ක් ද නම් එක් එක් භාණ්ඩයෙන් ලැබෙන ලාභය වෙන වෙනම සොයන්න. (ලකුණු 25)

(ආ)සිමිත සුනෙර පොදු සමාගම නිපදවන එක්තරා භාණ්ඩයක් සඳහා යොදාගන්නා අමුද්‍රව්‍යයක් පිලිබඳ තොරතුරු පහත දී ඇත.(2026 ජනවාරි මාසයට අදාලව)

| දිනය | විස්තරය | ප්‍රමාණය (ඒකක) | ඒකක පිරිවැය (රු) |
|---|---|---|---|
| 01/01 | ආරම්භක ශේෂය | 1 000 | ? |
| 01/07 | මිලදී ගැනීම | 2 000 | 60 |
| 01/10 | නිකුත් කිරීම | 2 500 | ? |
| 01/15 | මිලදී ගැනීම | 4 000 | 55 |
| 01/20 | නිකුත් කිරීම | 2 500 | ? |
| 01/25 | මිලදී ගැනීම | 2 000 | 58 |
| 01/29 | නිකුත් කිරීම | 3 000 | ? |

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub

අතිරේක තොරතුරු

ආරම්භක තොගයේ ඒකක 600 ක් ඒකකයක් රු 50 බැගින්ද,ඉතිරිය ඒකකයක් රු 48 බැගින්ද,මිලට ගෙන තිබුණි.

අවශ්‍ය වන්නේ

1. පෙර පිවිසි පෙර පිට ක්‍රමය (F I F O) අනුව 2026 ජනවාරි මාසය සඳහා ගබඩා ලෙජරය පිළියෙල කිරීම
2. පෙර පිවිසි පෙර පිට ක්‍රමය (F I F O) අනුව ජනවාරි මාසයට අදාල විකුණුම් පිරිවැය ගණනය කිරීම
3. ජනවාරි මස අලෙවි කල සියළු භාණ්ඩ රු 80 බැගින් අලෙවි කලේ නම් දළ ලාභය ගණනය කරන්න.

(ලකුණු 15)

03.(අ). සඳළී ලී බඩු අලෙවි කිරීමේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලැබේ.2026 ජනවාරි 01 දිනට පහත ශේෂයන් ඔබට දී ඇත.

| | (රු 000) |
|---|---|
| දේපල පිරියට හා උපකරණ (පිරිවැයට) | 5 700 |
| සමුච්චිත ක්ෂය | 700 |
| තොගය | 600 |
| වෙළඳ ලැබිය යුතු දෑ (ධාරණ අගය) | 540 |
| වෙනත් ලැබිය යුතු දෑ | 20 |
| බැංකු ණය | 500 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 320 |
| උපචිත වියදම් | 30 |
| හිමිකම | ? |
| බැංකු | 640 |
| අත්තිකාරම් | 50 |

අතිරේක තොරතුරු

I. 2026.01.01 දින ලැයිස්තුගත මිල රු 300 000 ක් වූ ලී බඩු 10% ක වෙළඳ වට්ටමකට යටත්ව සාරාංගට ණයට විකුණා ඇති අතර මෙම භාණ්ඩවල පිරිවැය රු 216 000 කි.

II. 2026/01/01 දිනට පැවැති වෙළඳ ලැබිය යුතු දෑ , 10% ක හානිකරන අලාභ සඳහා ඉඩ හැරීමක් සිදුකිරීමෙන් පසු ධාරණ අගය ගණනය කොට ඇති අතර දළ වටිනාකමින් 60% ක් පියවීම සඳහා රු 350 000 ක මුදලක් ලැබී ඇත.

III. ලකුණු කළ මිල රු 250 000 ක් වූ භාණ්ඩ මිහිරිගෙන් ණයට මිලදී ගන්නා ලදී.මිහිරිගෙන් 10% ක වෙළෙඳ වට්ටමක් අඩු කරනු ලැබේ.

IV. 2025 දෙසැම්බර් මාසයට ගෙවිය යුතු රක්ෂණ වියදම ද ඇතුළුව රක්ෂණ වියදම් සඳහා රු 50 000 ක චෙක්පතක් නිකුත් කල අතර ජනවාරි මාසයේ රක්ෂණ ගාස්තුව රු 30 000 කි.ජනවාරි මාසයේ අවසන් දිනට සියළු රක්ෂන වියදම් ගෙවා අවසන් වී තිබුණි.

V. 2026/01/01 දිනට ලද අත්තිකාරම් ශේෂයෙන් දැක්වෙන්නේ 2026 ජනවාරි මාසයට අදාළව ලී බඩු විකිණීමක් සඳහා 2025 දෙසැම්බර් මාසය ලද අත්තිකාරම් මුදලකි. ජනවාරි මාසයේ රු 160 000 කට ඉංවොයිස් කර විකුණු භාණ්ඩවල පිරිවැය රු 100 000 ක් විය. හිඟ මුදල් නියමිත පරිදි ලැබී ඇත.

VI. 2026/01/01 සාරංග ට විකුණු භාණ්ඩවලින් රු 40 000 ක් වන භාණ්ඩ හරවා එවා ඇත.

VII. දේපල පිරියත හා උපකරණ පිරිවැයට වාර්ෂිකව 10% බැගින් ක්ෂය කෙරේ.

VIII. 2025 දෙසැම්බර් මාසයේ ව්‍යාපාරයේ සේවකයෙකු වූ සහන්ට ජනවාරි මාසයේ වැටුපෙන් අඩුකර ගැනීමට වැටුප් අත්තිකාරමක් ලබා දී ඇත.එය වෙනත් ලැබිය යුතු දෑ ශේෂයෙන් නිරූපනය වේ. ජනවාරි මාසයේ වැටුප රු 60 000 ක් වේ. මාසය අවසන් වන විට වැටුප්වලට අදාලව ගෙවිය යුතු වටිනාකමක් නොමැත.

IX. ව්‍යාපාරයට අයත් ගොඩනැගිල්ලක් බාහිර පාර්ශවයකට කුලියට ලබා දී ඇති අතර ජනවාරි මාසයට අදාලව රු 30 000 ක ගොඩනැගිලි කුලිය ජනවාරි අවසන් වන විටත් ලැබී නොමැත.


iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources

අතිරේක තොරතුරු

- 2026 ජනවාරි 31 දිනට තොගයේ ශුද්ධ උපලබ්දි අගය 535 000 ක් විය.
- ස්ථාවර නියෝග මත ගෙවූ ණය වාරිකය රු 18 000ක් වූ අතර එහි ඇතුළත් පොළිය රු 3 000 කි.
- අවසන් වෙළෙඳ ලැබිය යුතු දෑ ශේෂය මත 10% ක හානිකරන අලාභ සඳහා ඉඩ හැරීමක් සිදුකළ යුතුය.

අවශ්‍ය වන්නේ

1. 2026 ජනවාරි මස ආරම්භක ශේෂයන් සහ අංක (i) සිට (iX) තෙක් සිදුවී ඇති ගනුදෙනුවල බලපෑම ගිණුම්කරන සමීකරණය භාවිතා කරමින් පෙන්නුම් කරන්න. වටිනාකම ඉදිරියේ වැඩිවේ නම් (+) ද අඩුවේ නම් (-) ද යන්න සඳහන් කරන්න.පහත ආකෘතියට සමාන ආකෘතියක් භාවිතා කරන්න.

| ගනුදෙනු අංකය | වත්කම් | | | | | වගකීම් | | | | හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දේ/පි/උ | තොගය | වෙළඳ ලැබිය යුතු | වෙනත් ලැබිය යුතු | බැංකු | බැංකු ණය | වෙළද ගෙවිය යුතු | උපචිත වියදම් | අත්තිකාරම් | |
| ශේෂය | | | | | | | | | | |
| 01 | | | | | | | | | | |
| 02 | | | | | | | | | | |

2. 2026 ජනවාරි මාසය සඳහා ආදායම් ප්‍රකාශනය පිලියෙල කරන්න. (ලකුණු 25)

(ආ) සහරුවන්කෙත ව්‍යවසායකත්ව කවය ප්‍රදේශය අවට තරුණ තරුණියන්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් වර්ධනය කිරීම වෙනුවෙන් පිහිටුවා ගෙන ඇති ලාභ නොලබන සංවිධානයකි. මෙම සංවිධානය සතුව සම්මන්ත්‍රණ පැවැත්විය හැකි ශාලාවක් පවතින අතර, බාහිර පාර්ශවයන් සඳහා මුදල් අයකර කුලියට ලබාදීමත් සිදුකෙරේ.

I. 2025/03/31 දිනට සාමාජිකයන් 103 ක් මෙහි සාමාජිකත්වය ලබාගෙන ඇති අතර මාසික සාමාජික මුදල රුපියල් 500 කි. ඇතුලත් වීමේදී එක් වරක් පමණක් ගෙවිය යුතු රු 5 000 ක ඇතුළත් වීමේ ගාස්තුවක්ද සියලුම සාමාජිකයන්ගෙන් අය කෙරේ.ඇතුලත්වීමේ ගාස්තුව ලද වර්ෂයේ ආදායම ලෙස හඳුනා ගැනේ.

II. 2025/04/01 දිනට සාමාජිකයන් තිදෙනෙකුගෙන් ලැබිය යුතු සාමාජික මුදල රු 18 000 ක් වූ අතර සාමාජිකයන් හතර දෙනෙකුගෙන් කලින් ලද සාමාජික මුදල 24 000 කි.

III. 2024/2025 වර්ෂයට අදාළව ලැබිය යුතු සාමාජිකයන්ගේ සාමාජිකත්වය අහෝසි කිරීමට 2025.04.01 දින තීරණය කරන ලදී.

IV. 2025/2026 උසස් පෙළ අවසන් කල ප්‍රදේශයේ සිසුන් සඳහා ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහනක් සංවිධානය කළ අතර ඊට අදාළ තොරතුරු පහත වේ.

| | |
|---|---|
| අනුග්‍රාහකත්ව ලැබීම් | රු 210 000 |
| සම්පත්දායක ගෙවීම් | රු 40 000 |
| ගෙවූ මෙහෙයුම් වියදම් | රු 112 000 |
| 2026/03/31 දිනට ගෙවිය යුතු මෙහෙයුම් වියදම් | රු 28 000 |

V. සම්මන්ත්‍රණ ශාලාව බාහිර ආයතනවලට දිනකට රුපියල් 10 000 ක මුදලට කුලියට ලබා දෙන අතර ශාලාව වෙන් කිරීම සඳහා 40% ක අත්තිකාරමක් ප්‍රථමයෙන් ලබා දිය යුතු අතර වැඩසටහන අවසන් වූ පසුව හෝ මාසයක කාලයක් තුළ ඉතිරි හිඟ මුදල ගෙවා අවසන් කළ යුතුය. සම්මන්ත්‍රණ ශාලාව ලබාදීම පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| | |
|---|---|
| ප්‍රවර්ථන වර්ෂය තුළ කුලියට ලබා දුන් දින ගණන | දින 120 යි |
| 2025/04/01 දිනට අත්තිකාරම් ගෙවා වෙන්කර තිබූ දින ගණන | දින 02 යි. |

2025/04/01 දින වන විට ශාලාව බාහිර පාර්ශවයකට දින 04ක් කුලියට ලබා දී ඇත. අත්තිකාරම් මුදල පමණක් ගෙවා ඇත.

2026/03/31 දින වන විට ශාලාව දින 06කට කුලියට ලබා දී ඇති අතර අත්තිකාරම් මුදල පමණක් ලැබී ඇත.

